## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය - 2015

-----------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 09 දරන පනතින් සංශෝධිත 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2016 ඔක්තෝබර් 06 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
---------

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07
-----------------------------------------------

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 58,232,898 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2. ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, කාර්ය කිරීමේදී හා කර්තව්‍ය ඉටුකිරීමේදී ආයතනය විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු වුවත්, උක්ත විධිවිධානවලට පටහැනිව ආයතනය විසින් පරිත්‍යාග අරමුදල (Endowment Fund) නමින් වෙනම අරමුදලක් පිහිටුවා තිබුණි. මෙම අරමුදලේ ගිණුම් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කිරීමට 2012 ජූලි 26 වන දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නියෝග කර ඇතත් එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද මෙම අරමුදලේ කටයුතු මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීම වෙනුවට සම්බන්ධිත පාර්ශව ගනුදෙනුවක් ලෙස ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර තිබුණි.

2.3 ලැබියයුතු මුදල්
------------------

ව්‍යාපෘති 2 ක් වෙනුවෙන් ණයගැතියන්ගෙන් වසරකට වැඩි කාලයක සිට ලැබිය යුතු රු.1,873,227ක් හා තරුණ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.1,147,747 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- | --- |
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වන වගන්තිය | 2015 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය පාලක මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ආයතනය විසින් නිවැරදිව හා යාවත්කාලීනව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.3 ඡේදය | පිරිවැය රු.410,630 ක් වූ පුස්තකාල පොත් වාර්ෂික සමීක්ෂණයට භාජනය කර සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.1,119,500 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 744,965 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 374,535 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් නොවන වියදම් රු.489,067 ක් අඩුවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර 2014 වර්ෂයේ දී එය රු. 863,938 කින් පිරිහී නැවතත් සමාලෝචිත වර්ෂයේ දී රු. 119,500 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ දී රු.63,237,093 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂයේදී රු. 88,258,767 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති 24 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර රු.56,500,000 ක ආදායමක් ලබා කරගැනීමට අපේක්ෂා කළද, කාර්යසාධන වාර්තාවට අනුව ව්‍යාපෘති 40 ක් ක්‍රියාත්මක කර රු. 36,068,000 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් අත්තිකාරම් ලෙස ලැබී තිබූ රු.2,000,203 ක් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ ව්‍යාපෘති 11 ක ව්‍යාපෘති නිමකිරීමේ කාලය මාස 04 සිට අවුරුදු 01 අතර විය.

(ඇ) 2014 ඔක්තෝබර් 01 දින සිට 2019 මාර්තු 01 දක්වා කාලපරිච්ඡේදයේ ක්‍රියාකාරීත්ව කටයුතු සඳහා ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ ආයතනයෙන් කැනේඩියානු ඩොලර් 950,000 ක මූල්‍ය දායකත්වයක් ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ ආයතනය සමඟවූ ගිවිසුමට අනුව පළමුවන තාක්ෂණික ප්‍රගති වාර්තාව සමඟ ආයතනයේ අයවැය සහ ක්‍රියාකාරී සැළැස්ම සකස් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම රු.27,750,000 ක් වූ අතර සත්‍ය ආදායම රු.23,902,995 ක් වී තිබුණි. ඒ අනුව සත්‍ය ආදායම අපේක්ෂිත ආදායමට වඩා සියයට 14 කින් අඩුවී තිබුණි.

(iii) ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ ආයතනයේ මූල්‍ය දායකත්වය අනුව ව්‍යාපෘති 04 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 නිශ්ක්‍රීය වත්කම්
------------------

2015 දෙසැම්බර් 31 දිනට මුද්‍රණ හා ප්‍රකාශන අංශයේ රු.1,114,813 ක් වටිනා පොත් 2098 ක් 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 10 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි.

4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්
----------------------------------

ආයතනය පවත්වාගෙන යන ගොඩනැගිල්ල 2011 වර්ෂයේදී ඉදිකර තිබූ නමුත් එය ඉදිකර තිබුණු ඉඩම ආයතනය නමින් පවරා ගැනීමේ කටයුතු මේ දක්වා සිදුකර නොතිබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය
----------------------------------------

5.1 සංයුක්ත සැළැස්ම
--------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැළැස්මක් සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය එපරිදි කටයුතු කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැළැස්ම
---------------------

ආයතනයේ ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර තිබුණු අතර එහි සඳහන් කාර්යයන්වල තථ්‍ය කාර්යසාධනය මැනීම සඳහා කාර්යසාධන ඉලක්ක හඳුන්වා දී නොතිබුණු අතර ක්‍රියාකාරී සැළැස්ම කාලීනව සමාලෝචනය කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.